## 1.1 හැඳින්වීම

විද්‍යුත් මාධ්‍යය හා සජීවීව නැරඹීම වෙනස් වන්නේ, ප්‍රේක්ෂකයා තොරතුරු හා සම්බන්ධ වීම හා නොවීම මත ය. රූපවාහිනිය විද්‍යුත් මාධ්‍යයක් වශයෙන් ප්‍රේක්ෂක ඇස හා කන සජීවී ව ග්‍රහනය කරගන්නා සීමාව ඉක්මවා යයි. මේ නිසා ප්‍රසංගවේදිකාව ප්‍රේක්ෂකයා හා නිර්මාණය අතර සම්බන්ධය හුදෙක් සජීවී බැවින් ඔබ්බට ගොස්, තාක්ෂණික පෙරළියෙන් පසු ප්‍රේක්ෂකයා ට විද්‍යුත් මාධ්‍යයක් ඔස්සේ ගෙන එයි.

රූපවාහිනිය මිනිස් වර්ගයා කෙරෙහි අනූපමේය බලපෑමක් කරන අතර, එයට ම ආවේනික සංස්කෘතියක් ද, නිර්මාණය කොට ඇත . වේදිකාවක් ඉදිරිපිට, විවිධ අපහසුතාවයන් විඳගනිමින්, සංගීත ප්‍රසංගයක් නැරඹීම ට වඩා, රූපවාහිනිය ඉදිරිය ට වී එම ප්‍රසංගය නැරඹීමට බොහෝ පිරිස් සැදී පැහිදී සිටිති. මෙහි දී මෙම බහුතරයක් වූ ප්‍රේක්ෂක පිරිසට සාධාරණයක් වීම පිණිස මෙම තාක්ෂණික පෙරළිය ට නිර්මාණශීලී ප්‍රවේශයක් ලබාදීම වැදගත් වේ. මෙහි දී, රූපවාහිනී ප්‍රේක්ෂකයා ගේ බලාපොරොත්තුව, කැමැත්ත කුමක්දැ යි වටහා ගෙන ප්‍රසංග වේදිකාව රූපමාධ්‍යය ට නැගිය හැකිය.

මිනිසා තොරතුරු පිපාසයෙන් සිටින බැවින්, ඔවුන් ආකර්ශණය කරගැනීමට සුදුසු ආකාරයට රූපවාහිනී වැඩ සටහන් සිදු වේ. විද්‍යුත් ක්‍රියාවලියන් සුදුවන මෙහි දි තාක්ෂණික උපකරණ රාශියක් භාවිතා කිරීමට සිදු වේ. කැමරාව, සංස්කරණය යන්ත්‍ර , ශබ්ද පටිගත කිරීමේ යන්ත්‍ර , විදුලි ආලෝක උපකරණ ආදිය ඒ අතර ප්‍රධාන වේ. නමුත් මේවා භාවිතයේ දී අනුගමනය කළ යුතු සුවිශේෂී නිර්මාණාත්මක පැතිකඩක් ඇත . එය වර්ධනය කොට නිපදවන වැඩසටහන් සඳහා, ග්‍රාහක ආකර්ෂණය වැඩිවීම සාමාන්‍ය සංසිද්ධිය කි.

ප්‍රසංගවේදිකා නිර්මාණකරුවා තම නිර්මාණය සිදුකරන විට, එහි ප්‍රේක්ෂක පිරිස තීරණය කරන අතර, ඒ කෙසේ නමුත් රූපවාහිනී ප්‍රේක්ෂකයා ට නිර්මාණකරු ගේ කලාකෘතිය නිර්මාණශීලීව ගෙනයාම වැඩසටහන් නිෂ්පාදක ඇතුළු තාක්ෂණික අංශයේ වගකීමකි.

වර්තමාන යේ ශ්‍රී ලංකාවේ ප්‍රසංග වේදිකාව තුළ නර්තනය, සංගීතය ප්‍රසංගිකව ගෙනයාම අත්‍යවශ්‍ය සාධකයක් සේ පෙනෙන අතර, විවෘත සංදර්ශන වේදිකාව (සජීවී ප්‍රෙක්ෂක සමූහයක් ඉදිරියේ සිදුකරන) එහි දී ප්‍රධාන වී ඇත . මෙහි දී, වේදිකාව ඉදිරියේ සිටින ජනතාව ගේ රසවින්දනය ද, රූප මාධ්‍ය නරඹන ග්‍රාහකයා ගේ රසවින්දනය යන කාරණා දෙකම සළකා බලා නිර්මාණාත්මකව කැමරාකරණය, ආලෝකකරණය, සංස්කරණය, ශබ්ද පටිගත කිරීම ආදී අංශයන් සැකසීම වැදගත් වේ.

වර්තමානයේ විවිධ විදෙස් නාළිකා වලින් දක්නට ලැබෙන ප්‍රසංග වේදිකාව හා ලංකාවේ රූපවාහිනිය මගින් දක්නට ලැබෙන ප්‍රසංග වේදිකාව සංසන්දනයේ දී, විශාල වෙනස්කමක් දක්නට ඇත . මෙහි දී ආර්ථික සාධක ප්‍රබලව බලපා ඇති අතර, ප්‍රසංග වේදිකාව රූප මාධ්‍යයට හසුකරගන්නා ශිල්පීන් ගේ අවබෝධය තවත් සධකය කි.

එනයින් සැළකූ කල , ප්‍රසංග වේදිකාව රූප මාධ්‍යට ගෙන ඒමේ දී, විශාල කර්යභාරයක් ඇති අතර, ඒ තුළ නිර්මාණශීලීත්වය අත්‍යවශ්‍ය සාධකය කි. මේ සඳහා ප්‍රසංග වේදිකාව තුළ නිර්මාණ, රූපවාහිනී මාධ්‍ය හා එහි ශක්‍යතා, එහි තාක්ෂනික අංශයන් හා ප්‍රසංග වේදිකාව ආදී විෂය කරුණු ඔස්සේ කරුණු ගෙනහැර දක්වනු ලැබී ය. කැමරාකරණය, ආලෝකකරණය, සංස්කරණය ආදී අංශ වලින්, ප්‍රසංග වේදිකා වැඩසටහනක් රූප මාධ්‍යයට ගෙන ඒමේ දී ඒවායේ මූලික කාර්යයන් පිළිබඳ විග්‍රහයක් ගෙනඑන ලදී .

ඒ සඳහා අදාළ වැඩසටහන් මූලාශ්‍ර නිරීක්ෂනය කිරීම හා හා ලංකාවේ දැනට ඒ ඒ අංශවල නිර්මාණකරණයේ යෙදී සිටින ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් හමු වී සම්මුඛ සාකච්ඡා පවත්වා, දත්ත රැස් කරගන්නා ලදී . තව ද, ලංකාවේ ප්‍රෙක්ෂකයින් මෙම කාරණය සඳහා දක්වන අවබෝධය  පිළිබඳ අදහසක් ලබාගැනීම ට ප්‍රශ්නාවලියක් මගින් ද, කරුණු විමසා බැලී ය. ඒ හරහා මේ නිබන්දනයේ අරමුණු හා අභිමතාර්ථ වෙත ළඟා විය.

උපන්‍යාසයන් ද දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂනය යටතේ ප්‍රශ්ණාවලිය හා අදහස් විමසීම මගින් සක්ෂාත් කර ගැනිණි. මෙතෙක් ප්‍රසංග වේදිකාව  රූප මාධ්‍යයට ගෙන ඒමේ නිර්මාණාත්මක අංශය සම්බන්ධව පර්යේෂන සිදු නොකළ අංශයක් පිළිබඳව පර්යේෂනය කරන ලද්දේ, අද ප්‍රසංග වේදිකාව රූප මාධ්‍යය ට ගෙන ඒමේ ප්‍රවණතාව ඉහළ මට්ටමක ඇති බැවිනි.

මෙම පර්යේෂන මාතෘකාව හුදෙක් නිබන්ධනයකට සීමා නොකොට, එම දත්ත පදනම් කරගනිමින් අනාගතයේ දී, ප්‍රසංග වේදිකාව රූපවාහිනියට ගෙන ඒමේ දී, එහි තාක්ෂණික අංගයේ නිර්මණාත්මක  බව වර්ධනය කරගැනීමටත්, විදේශ රටවල ඉතා ආකර්ෂනීය ව රූප මාධ්‍යයට ගෙන එන ප්‍රසංග වේදිකා හා සම වූ ප්‍රසංග වේදිකාවක් රූපවාහිනී මාධ්‍යයට ගෙන ඒම සඳහා දේශීය ශිල්පීන් යොමු කරවීම ට දායක වීමත්, මෙහි අරමුණ වේ .